# පරිසරවේදියා 2023

## ගුරුවරුන් සඳහා මාර්ගෝපදේශ

### 1. වැඩ සටහනේ අරමුණ

වේගයෙන් වාණිජකරණය වන වර්තමාන ලෝකයේ බොහෝ දෙමාපියන්ට දරුවන් සමග පරිසර ක්‍රියාකාරකම්වල යෙදීමට ඇති කාලය අඩුව ඇත. විභාග ඉලක්ක කරගත් අධ්‍යාපන ක්‍රමය හේතුකොටගෙන පෞද්ගලික පන්ති සඳහා දරුවන් යොමු කිරීමේ ප්‍රවණතාව ඉහළ යමින් පවතී. මේ හේතුකොටගෙන දරුවන් එළිමහන් ක්‍රියාකාරකම්වල යෙදීම හා ස්වාභාවික පරිසරය හා ගැටීමට ඇති කාලයත් බෙහෙවින් අඩු වෙමින් පවතී. එමෙන්ම, රූපවාහිනිය, පරිගණක, ජංගම දුරකථන හා අධිතාක්ෂණික මෙවලම් වලට ඇබ්බැහි වීම දරුවන් තවදුරටත් පරිසරය සමග ඇති සම්බන්ධතාව අඩුවිමට හේතු වී ඇත. මෙවැනි තත්ත්වයක් තුළ ගුරුවරුන්ට සහ දෙමාපියන්ට සිසු දරුවන් ස්වභාවික පරිසර අත්දැකීම් වලට යොමු කරවීම හා එතුලින් ඉගැන්වීමට අවස්ථාව සලසා දීම අභියෝගාත්මක කරුණක් බවට පත්වී ඇත. වර්තමාන දරුවන්ට අවම වශයෙන් තම ගෙවත්තේ හෝ පාසල් බිමේ හමු වන ඖෂධ පැළෑටියක්, කුඩා සතුන් කිහිපදෙනකු හෝ ප්‍රායෝගිකව හඳුනා ගැනීමට අපොහොසත් බව පෙනීයයි. එබැවින්, රටේ අනාගත පරපුර වන අද දරුවන්, දේශීයත්වය අගය කරන, සොබාවික පරිසරයට ආදරය සහ ගෞරවය දක්වන වගකිවයුතු පුරවැසියන් බවට කුඩාවියේ සිටම හුරුකරවීම සිදුකළ යුතුව ඇත. එබැවින් මෙම ළමා පරිසරවේදියා වැඩසටහන, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික විද්‍යා පදනම මඟින් වාර්ෂිකව පළමු ශ්‍රේණියේ සිට හය වන ශ්‍රේණිය දක්ව දරුවන් වෙනුවෙන සංවිධානය කරනු ලබයි.

### 2. වැඩසටහන සඳහා දරුවන් යොමු කළ යුතු ආකාරය

මෙම වැඩසටහනේ මූලික සංකල්පය වන්නේ දරුවෙකුට තමා ජීවත් වන පරිසරයේ හෝ පාසල් අවට පරිසරයේ යම්කිසි තෝරාගත් පරිසර සාධකයක් /ජීවියෙක්/ ශාකයක් පිළිබඳව සති 6ක කාලයක් නියමිත කාල රාමුවක් තුළ නිරීක්ෂණය කර වාර්තා කර ගැනීම සහ තමාගේ නිරීක්ෂණ ආශ්‍රිතව පරිසර දින පොතක් (natural journal) පිළියෙල කිරීමයි. මේ සඳහා සති 8ක කාලයක් ලබා දෙනු ලැබේ මෙම අධ්‍යයනය සඳහා නිවසේ සුරතලයට ඇති කරන සතුන් මල් පැළ වැනි දේ යොදා ගැනීමෙන් වළකින්න.

## 3. පරිසර අධ්‍යානයට යොදාගත හැකි ව්‍යාපෘති සඳහා - උදාහරණ කිහිපයක්

1. දරුවන්ට තම ගෙවත්තට පැමිණෙන කුරුල්ලන් නිරීක්ෂණය කළ හැක. එක් විශේෂයක් පමණක් තෝරාගෙන ඔවුන්ගේ හැසිරීම, ආහාර සොයා යාමේ පුරුදු (උදා: පොළොව මත ඇති ආහාර සොයාගැනීම, දඩයම් කර ආහාර සොයා ගැනීම ආදිය ), ආහාර සොයාගැනීම සඳහා ඔවුන්ගේ ශරීරය හැඩගැසී ඇති ආකාරය (උදා: හොටය, පාදය, බෙල්ල ආදී ) රංචු ගැසීම (රළක්, යුගලක් හෝ හුදෙකලාව ජීවත්වීම) ආදිය නිරීක්ෂණය කර වාර්තා කිරීම සිදු කළ හැක. මෙම සතුන්ගෙන් පරිසරයට ඇති ප්‍රයෝජන හෝ හානි සොයා බැලීමට ද දරුවාට මග පෙන්වන්න

2. අවට පරිසරයේ ඇති ඖෂධීය ශාක කිහිපයක් දරුවාට හඳුන්වා දෙන්න .ඉන්පසු ඒවා වැඩෙන පරිසරය ,එහි ස්වභාවය ,එය පඳුරක් ද , වැලක් ද යන්න මල් ගෙඩි හට ගන්නා ආකාර හඳුනාගත හැකි විශේෂ ලක්ෂණ ආදිය වාර්තා කිරීමට ඉඩ සලස්වන්න එහි ඖෂධීය වටිනාකම ආහාරයක් ලෙස යොදා ගත හැකිද යන්න පිළිබඳ තොරතුරු සොයා බැලීමට යොමු කරන්න. කුඩා පැලෑටියක් නම් පැළෑටියම ද නැතහොත් ශාක කොටස්ද වියළා අලවා ඒ පිළිබඳ වැඩිදුර තොරතුරු පොත් පත් මගින්, වැඩිහිටියෙකුගෙන් හෝ අන්තර්ජාලයේ විශ්වාසදායක වෙබ් අඩවි ආශ්‍රිතව ලබා ගැනීමට උපකාර කරන්න.

3. දරුවාට ගෙවත්තේ ඇති කෘමීන් වර්ගයක් තෝරා ගෙන (උදා කුහුඹුවන්, මකුළුවන්, කුරුමණියන්, සමනලුන් ආදිය) නිරීක්ෂණය කිරීමට යම් කාලයක් ලබා දෙන්න. එමෙන්ම අත් කාචයක් භාවිතයෙන් සමීපව නිරීක්ෂණය කිරීමට යොමු කරන්න. සතුරන්ගෙන් ආරක්ෂා වීමට ස්වභාවිකව ඔවුන් සකස් වී ඇති ආකාරය (සලබයන්, කෘමීන් පරිසරය සමඟ ජීවත් වීමට දක්වන අනුවර්තන) වාසස්ථාන සැකසීමට කටයුතු කරන ආකාරය (කුහුඹු ජනපදය) නිරීක්ෂණය කිරීමට යොමු කිරීම, පරිසරය හා දක්වන අනුවර්තන, වර්ණ රටා ආදිය නිරීක්ෂණය කර වාර්තා කර ගැනීමට යොමු කරන්න. මෙහිදී එක් සත්ව විශේෂයක් නිරීක්ෂණය සඳහා යොදා ගැනීම වඩා පුළුල් අධ්‍යයනයකට මග පාදයි.

4. ගෙවත්තට එන සතුන් (උදා: ලේනුන්, කටුස්සන්, වඳුරන්, මුගටියා ආදී සතුන්) නිරීක්ෂණය කර ඔවුන්ගේ ආහාර ගැනීමේ පුරුදු, පෙනුම, ඔවුන් ආහාර සොයන ආකාරය ආදිය නිරීක්ෂණය කිරීමට දරුවන් යොමු කරන්න. මෙහිදී මෙවැනි එක් සතෙකුගේ හැසිරීම් රටාව නිරීක්ෂණය කිරීම සෑහේ. තෝරාගත් සතාගේ වර්ගය, විශේෂය ,පිළිබඳව පොත පත ආශ්‍රිතව සොයා බලා අධ්‍යයනය කිරීමට දරුවාට උපකාර කරන්න. මොවුන්ගෙන් පරිසරයට ලැබෙන ප්‍රයෝජන වගා හානි පිළිබඳව අධ්‍යයනයට දරුවා යොමු කරන්න.

5. දිවා කාලයේදී අහසේ වලාකුළු වල ස්වභාවය අධ්‍යයනය කිරීමට දරුවා යොමු කරන්න. වර්ෂාවකට පෙර හෝ පසු විවිධ වලාකුළු රටා කාලය සමග වෙනස් වීම් නිරීක්ෂණය කර වාර්තා කිරීමට දරුවා යොමු කරන්න. අන්තර්ජාලය හෝ වෙනත් තොරතුරු භාවිතා කර වළාකුළු හැඩ හා අදාල

තොරතුරු පිළිබඳව දරුවා දැනුවත් කිරීමට කටයුතු කරන්න. විශේෂ දිනවලදී (උදා වැසි දින) යොදාගත් වේලාවන් වලට අමතරව වේලාවන්හි ද නිරීක්ෂණය සිදු කිරීමෙන් පරිසර වාර්තාවට අගය එකතු වීමක් සිදුවේ.

## 4. අධ්‍යයනය සඳහා දරුවන්ට ගුරුවරයෙකු වැඩිහිටියෙකුට මග පෙන්විය හැකි ආකාරය

1. නිරීක්ෂණය කළ යුතු යම් වස්තුවක් හඳුනා ගැනීමට දරුවාට සහාය වීම සහ නිරීක්ෂණ සඳහා කාල සටහනක් සැකසීම (උදා. උදේ 6, සවස 4). විශේෂ අවස්ථාවලදී අමතර කාලවලදීද නිරීක්ෂණය සිදු කිරීමට යොමු කරන්න.දිනය, වේලාව සමග සියලු අධ්‍යනයන් සිදුකළ ආකාරය, ලබාගත් නිරීක්ෂණ පිළිබඳව සටහන් පවත්වා ගැනීමට දරුවාව යොමු කරන්න.
2. පරිසර නිරීක්ෂණ කටයුතු සිදු කිරීමේදී සෑම විටම දරුවාගේ ආරක්ෂාව ගැන සැලකිලිමත් වන්න
3. ජාතික විද්‍යා පදනම මඟින් පරිසරය පිළිබඳ දේශන මාලාවක් 2023 ජුනි /ජූලි මාස තුල සංවිධානය කරනු ඇත. ජාතික විද්‍යා පදනමේ නිල YouTube නාලිකාව සහ නිල Facebook පිටුවට සම්බන්ධවීමෙන් මේ පිළිබඳ වැඩි දුර විස්තර ලබා ගත හැක .
(https://www.youtube.com/channel/UCWziS21LQ1L9xSDUZAKD5dw)
4. ලිවීමට අපහසු දරුවන් චිත්‍ර සටහන් රූප භාවිතයෙන් වාර්තා ඉදිරිපත් කිරීමට යොමු කරන්න.
5. දරුවාට තමාගේ නිරීක්ෂණ රූප සටහන්, වියලන ලද මල් කොළ ආදී විවිධ ක්‍රම භාවිතා කරමින් නිදහසේ ඉදිරිපත් කිරීමට ඉඩ දෙන්න
6. නිරීක්ෂණ ඔස්සේ දරුවා තුල පැන නගින ගැටළු විසඳාගැනීමට පොත්, අන්තර්ජාලය, වැඩිහිටියන් සතු දැනුම ආදිය ගැනීමට සහාය වන්න.
7. දරුවාට අනන්‍ය වූ ආකාරයකට , ඔවුන්ගේ හැකියාව දක්ෂතා උපයෝගී කරගෙන පරිසර දින පොත නිර්මාණය කිරීම සඳහා උපරිම නිදහස සහ ඉඩ ලබාදෙන්න.
8. දරුවාගේ සිතුවිලි හෝ ප්‍රකාශනවලට බාධා නොකර හැකිතාක් නිවැරදිව භාෂාව, ව්‍යාකරණ, අකුරු භාවිතා කිරීමට උපකාර කරන්න.
9. ව්‍යාපෘති කාලපරිච්ඡේදයේ පළමු සති හය තුළ ළමයෙකුට අදාළ ද්‍රව්‍ය (වියළි මල්, කොළ, බීජ, කුරුලු පිහාටු ආදිය) එකතු කිරීම ආරම්භ කළ හැකි අතර ඒවා ආකර්ශනීය සඟරාවක් නිර්මාණය කිරීමට යොදා ගත හැකි ආකාරයට පිළියෙල කරගැනීම මෙම කාලයේදී සිදු කිරීමට දරුවා යොමු කරන්න
10. අත්‍යවශ්‍යම තැන් වලදී පමණක් ඡායාරූප භාවිතා කිරීමට උපදෙස් දෙන්න දරුවාගේ නිර්මාණශීලීත්වයට සැමවිටම මුල්තැන දෙන්න. සඟරා, පොත්පත්, අන්තර්ජාලය ආදී ප්‍රභවයන් ඔස්සේ ලබාගත් පින්තූර දින පොත සකස් කිරීමට භාවිත නොකරන්න.
11. මාර්ගෝපදේශයක් සඳහා පමණක් ලබා දී ඇති පරිසර දින පොත් ආකෘතිය භාවිතය දරුවාගේ නිර්මාණශීලීත්වයට බාධාවක් නොවන ලෙස භාවිතා කිරීමට යොමු කරන්න. (ඇමුණුම III).

## 5.පරිසර දින  පොත පිළියෙළ කිරිමේ දී සැලකිය යුතු කරුණු

1. පරිසර දිනපොත දරුවාගේ අත්අකුරින් සැකසිය යුතු අතර පරිගණකයෙන් ටයිප් කිරීමෙන් සකසන ලද වාර්තා පිළිගනු නොලැබේ. දරුවාට ඉතා හොඳින් ලිවීමට නොහැකි නම්,  රූප සටහන් භාවිතයෙන් ප්‍රකාශනය සිදු කල  හැක.
2. රූප සටහන් මගින් වාර්තා කිරීමේ දී පැස්ටල්  දිය සායම් පාට පැන්සල් ආදි සුදුසු වර්ණ  භාවිතා කළ හැක
3. වාර්තා කිරීමේදී වැඩිහිටියන් විසින් භාවිතා කරන ඉහළ තාක්ෂණික, විද්‍යාත්මක යෙදුම් හෝ භාෂාව භාවිතා කිරීමට දරුවන් පෙලඹවීමෙන් වලකින්න. සරල වචන භාවිතා කර දිනපොත සැකසීමට දරුවන්ට ඉඩදෙන්න.
4. උපදෙස් පත්‍රිකාවේ දක්වා ඇති පරිදි පරිසර දින පොතේ පිටු එකතු කරන්න. ඇගැයීම සඳහා ලිහිල් පත්‍රිකා හෝ  අක්‍රමවත් ලෙස එකතු කරන ලද පත්‍රිකා සලකා බලනු නොලැබේ.
5. මිල අධික කඩදාසි හෝ ලිපි  ද්‍රව්‍ය  භාවිතා කිරීමෙන් වළකින්න. පැහැදිලි  කඩදාසි (සුදු හෝ වර්ණ) අවශ්‍ය පරිදි භාවිතා කරන්න  ඉවතලන ද්‍රව්‍ය භාවිතා කර නිර්මාණ කිරීම උනන්දු වන්න.

## 6.වැඩසටහනට ලියාපදිංචි වීම

වැඩසටහනට සහභාගී වීමට කැමැත්තක් දක්වන දරුවන්ට  2023 ජුනි 30වන දිනට පෙර පහත දක්වා ඇති ඕනෑම විකල්පයක් භාවිතා කර තම අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමෙන් වැඩසටහනට ලියාපදිංචි විය හැකිය (කරුණාකර අනුපිටපත් කිරීම වළක්වා ගැනීම සඳහා එක ක්‍රමවේදයක් පමණක් භාවිතා කරන්න).

ක්‍රමය I

ගූගල් පෝරමය භාවිතා කිරීමෙන් - https://forms.gle/vf3DGSFgWvSnjxhp7

ක්‍රමය II

අයදුම්පත )ඇමුණුම-1 ඇති ) පුරවා "Kid Naturalist 2023" විෂය ලෙස සඳහන් කරමින් ajantha@nsf.gov.lk සහ chamarika@nsf.gov.lk වෙත විද්‍යුත් තැපැල මඟින් යොමු කිරීම.

ක්‍රමය III

අයදුම්පත (ඇමුණුම-1 ඇති ) පුරවා අධ්‍යක්ෂ ජනරාල්,  ජාතික විද්‍යා පදනම, 47/5, මේට්ලන්ඩ් පෙදෙස, කොළඹ 7. වෙත යොමු  කරන්න. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "Kid Naturalist 2023"  ලෙස සඳහන් කරන්න.

## 7. පරිසර දින පොත ඉදිරිපත් කිරීම

දරුවන් විසින් සකස් කරන ලද පරිසර දින පොත 2023 අගෝස්තු මස 11 වන දින හෝ ඊට පෙර ලිපියේ වම් පස ඉහල කෙළවර Kid Naturalist 2023 ලෙස දක්වා පහත ලිපිනයට යොමු කරන්න.

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික විද්‍යා පදනම
47/5, මේට්ලන්ඩ් පෙදෙස
කොළඹ 7.

ඉදිරිපත් කරන ලද අදාළ පරිසර දින පොත, තරඟයේ ජයග්‍රාහකයින් ජාතික විද්‍යා පදනමේ නිල වෙබ් අඩවිය ඔස්සේ ප්‍රකාශයට පත් කිරීමෙන් පසු මාස දෙකක් ඇතුළත රජයේ වැඩ කරන දිනවල පෙ.ව 9.00 සිට සවස ප.ව 4.00 දක්වා ජාතික විද්‍යා පදනම් පරිශ්‍රයේදී ලබා ගත හැක.